# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල


| දිනය Date | 2025.04.14 පැය 0840 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/731/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|

**සුළු පරිමාණ, මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා විශේෂ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම.**

දිවයින තුළ ක්‍රියාත්මක වන නීති විරෝධී මත්ද්‍රව්‍ය විකිණීම, ප්‍රවාහනය, ජාවාරම් කිරීම හා සන්තකයේ තබා ගැනීම ඇතුළු මත්ද්‍රව්‍ය ජාවාරම් ජාලය හඳුනාගෙන ඔවුන්ගේ ක්‍රියාකාරකම් මර්ධනය කිරීම හා ඊට අදාල ඉදිරි නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා දැනටමත් ශ්‍රී ලංකා පොලිසිය මඟින් ඉටු කරනු ලබන කාර්යභාරය තවදුරටත් වර්ධනය කිරීම සඳහා වැඩබලන පොලිස්පතිතුමා විසින් සියළුම උසස් නිලධාරීන්ට හා ස්ථානාධිපතිවරුන් වෙත විශේෂ පණිවිඩයක් මඟින් උපදෙස් ලබා දී ඇත.

ඒ අනුව 2025.04.13 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පොලිස් කොට්ඨාස මට්ටමින් බුද්ධි තොරතුරු රැස් කර පොලිස් වසම් ආශ්‍රිතව දැනට සක්‍රීයව පවතින මත්ද්‍රව්‍ය ජාලයන් හඳුනාගෙන ඔවුන් අත්අඩංගුවට ගැනීම සඳහා විශේෂ මෙහෙයුම් සියළුම ප්‍රාදේශීය පොලිස් කොට්ඨාස ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීමටත්, ඒ සඳහා ස්ථිර හා ක්ෂණික මාර්ග බාධක යෙදවීමටත්, පවතින නෛතික ප්‍රතිපාදන වලට අනුකූලව වටලා සෝදිසි කිරීම හා මුර සංචාර යෙදවීමටත් දන්වා ඇත.

මෙම මෙහෙයුමේදී අවශ්‍යතාවය අනුව විශේෂ කාර්ය බලකා නිලධාරීන්ගේ හා හමුදා සේනාංක සහය මෙන්ම කොට්ඨාස නිළ සුනඛ ඒකකයේ සහයද ලබා ගැනීමටත් කටයුතු කෙරෙනු ඇත.

තවද, නීති විරෝධී විෂ මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීම, ප්‍රවාහනය කිරීම, සන්තකයේ තබා ගැනීම හා විකිණීම යන වැරදි සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලබන සැකකරුවන්ට අදාල විමර්ශන සඳහා ප්‍රමාණවත් කාලවේලාවක් නොමැති අවස්ථාවකදී ගරු අධිකරණය වෙතින් රැඳවුම් නියෝගයක් ලබා ගැනීමටත් වැඩිදුරටත් උපදෙස් ලබා දී ඇත.

මෙම මෙහෙයුමට අදාලව මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සම්බන්ධයෙන් සිදු කරනු ලබන විමර්ශන වලදී යම් සැකකරුවෙකු විසින් මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගන්නා ලද බවට කරුණු අනාවරණය වන වාහන හා දේපල පවතී නම් ඒ සම්බන්ධයෙන් මුදල් විශුද්ධිකරණ පනත යටතේ වෙනම විමර්ශනයක් සිදු කිරීමටත් ඒ සඳහා එම විමර්ශන අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව වෙත යොමු කිරීමටත් කටයුතු කෙරෙනු ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**